මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතිය (අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) - 2019.

---

මහ කොළඹ ජලය හා අපජලය කළමනාකරණය වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන - 02 ව්‍යාපෘතියේ (අඹතලේ බලශක්ති ඉතුරුම් ව්‍යාපෘතිය) 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ එහි කටයුතු පිළිබඳව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සහ ඒජනස් ෆැන්කයිස් ඩි.ඩිව්ලොප්මන්ට් අතර 2014 සැප්තැම්බර් 29 දින එළඹි අංක සී.එල්.කේ.1008-01පි දරණ ණය ගිවිසුමේ 3.4.2(එච්)වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කළයුතු යැයි මා සලකන මාගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු , අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශය, වර්තමානයේ ජල සම්පාදන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මහ කොළඹ ප්‍රදේශයේ ජල සැපයුම් ප්‍රවේශය පුළුල් කිරීම හා ජල පද්ධතියේ, තිරසාර බව පෝෂණය කිරීම ව්‍යාපෘතියේ අරමුණ වේ. ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 13,000 කට සමාන එජඩො මිලියන 100 ක් වන අතර ඉන් රු.මිලියන 9,100 කට සමාන එජඩො මිලියන 70 ක් මූල්‍යයනය කිරීමට ඒජන්ස්ෆැන්කයිස් ඩීඩිවෙලොප්මන්ට් එකඟවී තිබුණි. ඉතිරි රු.මිලියන 3,900 ක වටිනාකම ශ්‍රී ලංකා රජය විසින් මූල්‍යනය කිරීමට අපේක්ෂා කෙරේ.ව්‍යාපෘතිය එහි කටයුතු 2014 සැප්තැම්බර් 29 දින ආරම්භ කර තිබුණු අතර, 2018 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම්කර තිබුණි. කෙසේ වෙතත්, ව්‍යාපෘති කාල සීමාව 2022 මැයි 21 දින දක්වා දීර්ඝ කර ඇත.

1.3 තත්ත්වාගණනය කළ මතය

මාගේ වාර්තාවේ 2 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය හා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝවෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳව අදහස් දැක්වීම

2.1 ගිණුම්කරණ අඩුපාඩු

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| (අ) | අයිසීබී 04 හි අන්තර්ගෙවීම් බිල්පත්‍රයෙන් නැවත අයකරගත් කොන්ත්‍රාත්කරුට ගෙවීම් කරන ලද රු.මිලියන 8.43 ක වැඩ පූර්ව අත්තිකාරම් හා රු.මිලියන 2.8 ක රඳවාගැනීමේ මුදල් මූල්‍ය ප්‍රකාශන වෙත ගෙන නොතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ව්‍යාපෘතියේ කෙරීගෙන යන වැඩ ගිණුම ඊට සමාන ප්‍රමාණයකින් අඩු වී තිබුණි. | කෙරීගෙන යන වැඩ ගිණුම අඩුවෙන් දැක්වීම. | මෙම මුදල් අදාල වනුයේ කොන්ත්‍රාත්කරුවන්ගේ ගෙවියයුතු බිල්පත් වසර අවසානයේ ගිණුම්කරනයේදීය. විගණකවරුන්ගේ නිර්දේශ මත අපි වසර අවසානයේදී ගෙවිය යුතු මුදල් අනාගතයේදී ගිණුම්ගත කරන විට වැඩ පූර්ව අත්තිකාරම් හා රඳවාගැනීමේ මුදල් හඳුනාගැනීමට කටයුතු කරන්නෙමු. | ඌණතාවය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | මීටර් 13,691 ක නල ඇතිරීමේ වැඩ නිමකිරීමෙන් පසුව කාපට් ඇතිරීම සඳහා එකතුව වූ රු.මිලියන 402.80 ක් මාර්ග සංවර්ධන අධිකාරියට හා පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට (එකතුකල අගය මත බදු රහිතව ) ගෙවා තිබුණි. කෙසේ වෙතත් 2019 දෙසැම්බර් 31 දිනට මීටර් 588 ක් පමණක් නළ ඇතිරීම වැඩ සම්පූර්ණ කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස සම්පූර්ණ නොකරන ලද මීටර් 13,103 ක නල ඇතිරීමේ වැඩවලට අදාලව ආසන්න වශයෙන් වටිනාකම වූ රු.මිලියන 382.63 කින් කෙරීගෙන යන වැඩ ගිණුම වැඩියෙන් දක්වා තිබුණි. | කෙරීගෙන යන වැඩ ගිණුම වැඩියෙන් දැක්වීම | සේදවත්ත - අඹතලේ මාර්ගය පුරා ස්ථිර මාර්ග පුනස්ථාපනයනය (සම්පූර්ණ ආවරණය) සඳහා රු.මිලියන 464 ක් මාර්ග සංවර්ධන අධිකාරිය සහ පලාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත සම්පූර්ණයෙන් ගෙවීම් කරන ලදී, 2019 දෙසැම්බර් 31 දින දක්වා දුර ප්‍රමාණය මීටර් 1,388 ක නල ඇතරීම් හා දුරප්‍රමාණය මීටර් 588 ක ස්ථිර මාර්ග පුනස්ථාපන කටයුතු සිදුකර තිබුණි. නල ඇතිරීමේ ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට ප්‍රථමව මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවීම් සිදුකර, ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරීයේ අවසරය ලබා ගත යුතුය. එසේම මෙම ගෙවීම ප්‍රදානය කරන ලද කොන්ත්‍රාත් වටිනාකමෙහි කොටසක් නොවන අතර දේශීය අරමුදලින් | ඌණතාවය නිවැරදි කිරීමට පියවර ගත යුතුය. |

සිදුකරන ලද්දකි. කෙසේ වෙතත්, මෙම වටිනාකම ව්‍යාපෘතිය සඳහා පිරිවැයක් වන අතර භෞතික ප්‍රගතියේ දක්වා නොමැත. විගණකවරුන්ගේ උපදෙස් අනුව 2020 වසර අවසානයේ මූල්‍ය ප්‍රකාශයන්හි අපි ගැලපීම් කරන්නෙමු.

## 3 භෞතික කාර්ය සාධනය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතිය එහි ක්‍රියාකාරකම් කටයුතු 2014 සැප්තැම්බර් 29 වන දින ආරම්භ කර ඇති අතර එය 2019 ජුනි 30 දිනට අවසන් කිරීමට සැලසුම් කර ඇත.කෙසේ වෙතත් නියමිත කාල සීමාව තුල ඉලක්ක සපුරාගැනීමට අපොහොසත් වීමට හේතුවෙන් ව්‍යාපෘතියේ කාල සීමාව 2022 මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණි. ව්‍යාපෘතියේ ප්‍රගති වාර්තාවලට අනුව 2019 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 23.08 ක් සහ 21.96 ක් විය. ක්‍රියාකාරකම් අනුව භෞතික ප්‍රගතිය පහත පරිදි වේ.

| අංකය | ක්‍රියාකාරකම් | ඒකක | අපේක්ෂිත ඉලක්ක | 2019 දෙසැම්බර් 31 දිනට ළඟාකරගත් ඉලක්ක | බලපෑම් | කළමනාකරනයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|---|---|---|
| (අ) | අඹතලේ සිට එලි හවුස් ජලාශය දක්වා කි.මී.9 ක මෘදු යකඩ ජලනල (මි.මි. 1200 විෂ්කම්භය) හා උපාංග සපයා එලීම් කිරීම (අයිසිබී - 04)<br>➢ නළ එළීම<br>➢ සමස්ථ භෞතික ප්‍රගතිය | මීටර්<br>ප්‍රතිශතය | 9,000<br>100 | 1,388.35<br>26.08 | ඉදිකිරීම් ප්‍රමාද වීම හා නියමිත කාල සීමාව තුල කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට නොහැකි වීම. එහි ප්‍රතිපලයක් ලෙස කොන්ත්‍රාත්තුව සහ ව්‍යාපෘති කාලය දීර්ඝ වීමේ හැකියාව. | ඒ.එෆ්.ඩී. විසින් අරමුදල් බෙදා හැරීම තාවකාලිකව අත්හිටුවීම හේතුවෙන් ගෙවීම් නොකිරීම නිසා කොන්ත්‍රාත්කරු විසින් කොන්ත්‍රාත්තුව අවලංගු කරන ලදී. අයවැය ප්‍රතිපාදන නොලැබීම හේතුවෙන් ගෙවීම් ප්‍රමාද විය. සංශෝධන 1 අනුව සියළුම ගෙවීම සිදු කර ඇති අතර 2019 නොවැම්බර් 25 දින නැවත වැඩ කටයුතු ආරම්භ කරන ලදී. | සැලසුම් කල කාල සීමාව තුල වැඩ කඩිනමින් කිරීමට පියවර ගත යුතු වන අතර ව්‍යාපෘති අධීක්ෂණ ඒකකය විසින් කොන්ත්‍රාත් කටයුතු සමීපව අධීක්ෂණය කල යුතුය. |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| (ආ) | අඹතලේ පහසුකම්වල විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම හා බලශක්තිය ඉතිරිකිරීම සඳහා සුදුසු ධාරිතාවයකින් යුතු කාර්යක්ෂම පොම්ප ස්ථාපනය කිරීම, සර්ෂණය අඩු කිරීම සහ අනෙකුත් නිෂ්පාදන පහසුකම් වැඩි කිරීම තුලින් සම්ප්‍රේෂණ අලාභ අවම කිරීම. (අයිසීබී - 05) | ප්‍රතිශතය | 46.10 | 19 | | සම්ප්‍රේෂණ අලාභ හා බල බලශක්ති ඉතිරි කිරීම් අවම කිරීම සඳහා කාර්යක්ෂම පොම්ප සහ නිෂ්පාදන පහසුකම් සැපයීම හා ස්ථාපනය කිරීම ප්‍රමාද වීම | ව්‍යාපෘතිය සඳහා 2018 වසර අවසානයේදී අයවැය ප්‍රතිපාදන නොලැබීම නිසා වැඩ පූර්ව අත්තිකාරම් ගෙවීම ප්‍රමාද වීම. ඒඑෆ්ඩී හි නිවාඩු කාලය හේතුවෙන් ගෙවීම් ප්‍රමාදවීම, කොන්ත්‍රාත් කරුවන්ගේ දුර්වල කාර්ය සාධනය කොන්ත්‍රාත්කරුගේ අඩු ප්‍රගතිය හේතුවෙන් 'නිවැරදි කිරීමේ නොතේසි' නිකුත් කිරීම. | කාර්යක්ෂම පොම්ප සහ නිෂ්පාදන පහසුකම් සැපයීම සහ ස්ථාපනය කිරීම හා අනෙකුත් අදාල එලීම් කොන්ත්‍රාත්තු කඩිනම් කිරීමට පියවර ගත යුතුය. |
| (ඇ) | ජාතික සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ බස්නාහිර නිෂ්පාදන වෙත උපකරණ සහ යන්ත්‍රෝපකරණ සැපයීම (අයිසීබී -06) | ප්‍රතිශතය | 100 | 93 | | ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලය වෙත කාලීනව උපකරණ නොලැබෙනු ඇත. | කැබලි 'සී' සඳහා නැවත ටෙන්ඩරය කැඳවන ලදී. නමුත් කිසිදු යෝජනාවක් නොලැබුණු අතර කැබලි 'එෆ්' අත්හිටුවීම සහ කාර්යසාධන බැඳුම්කරය මුදල් කරගන්නා ලදී | කැබලි සී සහ එෆ් සඳහා ටෙන්ඩර් පිරිනැමීම සඳහා පියවර ගත යුතුය |
| (ඈ) | නිර්මාණ සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණ උපදේශන සේවා (ඩීආර්සීඑස්සී) | ප්‍රතිශතය | 98.04 | 74.46 | | කොන්ත්‍රාත්කරු විසින් ප්‍රධාන විශේෂඥයින් යෙදවීම ප්‍රමාදවීම හේතුවෙන් සැලසුම් කළ ව්‍යාපෘති කාල සීමාව තුළදී | ඉදිකිරීම් කොන්ත්‍රාත් 3හි අඩු ප්‍රගතිය හේතුවෙන් සැලසුමට අනුව විශේෂඥයන්ගේ කොටසක් සේවයෙහි නොයෙදවීය. 2019 ජුනි 1 සිට වසරක කාලයක් කොන්ත්‍රාත්තුව දීර්ඝ කර ඇත. | සංශෝධනය කළ වැඩ සැලැස්ම ප්‍රකාරව වැඩ කඩිනම් කිරීමට කොන්ත්‍රාත්කරුව න්ට උපදෙස් ලබා දිය යුතු අතර කොන්ත්රාත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අපේක්ෂිත උපදේශන සේවාව ව්‍යාපෘතියට ලබා ගැනීමට නොහැකි වීම. එහි ප්‍රතිඵලයක් ලෙස උපදේශන කොන්ත්‍රාත් කාල සීමාව දීර්ඝ වීමේ හැකියාව | | කටයුතු සමීපව අධීක්ෂණය කළ යුතුය |
| (ඉ) | කි.මී. 5ක් සඳහා මි.මී. 1,200 මෘදුයකඩ නල සැපයීම සහ එලීම ඇතුළු ගොතටුව ජලාශය හා අධි පීඩන බලැති පොම්පාගාරයක් ඉදිකිරීම. (අයිසීබී - 03) | 2019 ජුනි 12 දින සුහදව කොන්ත්‍රාත්තුව අවසන් කර ඇති අතර 2020 අගෝස්තු 4 දින දෙවන අඩුම ලංසුකරු වෙත නව කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර ඇත. | ඉදිකිරීම් ප්‍රමාදවීම හා ව්‍යාපෘති කාලසීමාව දීර්ඝවීමේ හැකියාව. | අයිසීබී 03 කොන්ත්‍රාත්තුව මුල් කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කරන අවස්ථාවේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව කොන්දේසි සහිතව අයි ඩී එච් ඉඩම ලබාගත හැකි විය. කෙසේ වෙතත් අයිසීබී 03 කොන්ත්‍රාත්තුව සුහදව අවසන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට අයි ඩී එච් රෝහල සඳහා නිල නිවාස 06 ඉදි කිරීමේ වගකීම ඉටු කිරීමට නොහැකි විය. කොන්ත්‍රාත් ප්‍රදානය හා අයි ඩී එච් කළමනාකරණයෙන් | නියමිත කාල සීමාව තුළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට පියවර ගතයුතු වීම කොන්ත්‍රාත්කරුගේ වැඩ සමීපව අධීක්ෂණය කිරීමට පියවර ගත යුතුයි. |

ඉඩම් ලබා ගැනීම අතර කිසිදු ගැටළුවක් නොවීය. අවසාන වශයෙන් කොවිඩ්19 වසංගතය සහ අනෙකුත් සෞඛ්‍ය ගැටළු හේතුවෙන් ඉහත අරමුණ සඳහා ඉඩම නිදහස් කිරීම අයිඩීඑච් කළමනාකරණය ප්‍රතික්ෂේප කළ අතර කොවිඩ් 19 වසංගතය පැන නැගීම හේතුවෙන් 2020 අගෝස්තු 4 දිනට අයිසීබී 03 කොන්ත්‍රාත්තුව දෙවන අඩුම ලංසුකරුට ප්‍රදානය කිරීම ප්‍රමාද වීම. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව මාස 20 ක කාල සීමාවක් සඳහා 2020 අගෝස්තු 04 දින ප්‍රදානය නිසා 2022 ජනවාරි 31 දිනට පෙර කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි වනු ඇත.

3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| --------- | --------------------- | ---------- | ------------------------------------ | ------------------- |
| (අ) | නිර්මාණ සමාලෝචනය සහ ඉදිකිරීම් අධීක්ෂණ සඳහා වන උපදේශන කොන්ත්‍රාත්තුව 2015 දෙසැම්බර් මසදී ප්‍රදානය කරන ලද අතර එය 2019 මැයි 31 වන විට අවසන් කිරීමට නියමිත විය. පසුව, උපදේශන කාලය | අනාගතයේදී උපදේශන පිරිවැය ඉක්මවා යා හැක. | 2016 ජූනි 01 දින උපදේශන කොන්ත්‍රාත්තුව ආරම්භ කරන ලදී. ඉදිකිරීම් කොන්ත්‍රාත් පැකේජ් ප්‍රමාදවීම හේතුවෙන් මූලික සැලැස්මට අනුව ජාත්‍යන්තර හා දේශීය | ඉදිකිරීම් කටයුතු කඩිනම් කිරීමට කොන්ත්‍රාත්කරුට උපදෙස් දිය යුතු අතර කොන්ත්‍රාත්කරුවන්ගේ |

| | | | | |
|---|---|---|---|---|
| | 2020 මැයි 31 දක්වා දීර්ඝ කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට උපදේශන කොන්ත්‍රාත්තුවේ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 74.46 ක් හා සියයට 57.50 ක් වූ අතර එය 2020 මැයි 31 දිනට පිළිවෙලින් සියයට 84.86 ක් හා සියයට 60.52 ක් විය. | | විශේෂඥයින් යොදවා නොතිබුණි. | වැඩ සමීපව අධීක්ෂණය කල යුතුය. |
| (ආ) | අඹතලේ සිට එලි හවුස් ජලාශය (අයිසීබී -04) දක්වා කි.මී.9 මෘදු යකඩ නළ (මි.මී.1200 විශ්කම්භය) සහ උපාංග සැපයීමේ හා එළීමේ කොන්ත්‍රාත්තුව 2016 ජූලි 01 වන දින ආරම්භ කර ඇති අතර එය ආරම්භ කල දින සිට දින 672 ක් ඇතුලත අවසන් කිරීමට නියමිතය. කෙසේ වෙතත්, ප්‍රදානකරු විසින් අරමුදල් බෙදාහැරීම් තාවකාලිව නැවැත්වීම හේතුවෙන්, 2018 සැප්තැම්බර් 01 දින සිට බලපැවැත්වෙන පරිදි කොන්ත්‍රාත්තුව අවලංගු කර ඇත. කොන්ත්‍රාත් ගිවිසුමේ සංශෝධන 01 ට අනුව, 2018 මැයි මාසයේදී වැඩ නැවත ආරම්භ කිරීමට නියමිතව තිබූ අතර මාස 07 ක කාලයකින් අනතුරුව 2019 නොවැම්බර් මාසයේදී නැවත වැඩ ආරම්භ කර ඇත. කොන්ත්‍රාත් කාර්යසාධන වාර්තාවට අනුව, 2019 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්තුවේ සමස්ථ භෞතික හා මූල්‍ය ප්‍රගතිය පිළිවෙලින් සියයට 26.08 ක් සහ සියයට 48.64 ක් විය. තවද 2019 දෙසැම්බර් 31 දිනට මුළු එළීම් මීටර් 9000 න් මීටර් 1338.35 ක් එනම් සියයට 14.87 ක් පමණක් නල එලීම් සිදු කර තිබූ අතර සම්පූර්ණ කරන ලද නල එලීම් සඳහා පීඩන පරීක්ෂාවන් 2020 ජූලි 31 දක්වා සිදුකරනොමැති විය. එම එලීම් 2020 ජූලි 31 දිනට මීටර් 3,347.92 කි. ස්ථිර මාර්ග පුනස්ථාපනය මීටර් 3347.92 න් මීටර් 1,019 ක එලීම් පමණක් සම්පූර්ණ කර තිබුණි. | නල එලීමේ කටයුතු ප්‍රමාදවීම නියමිත කාල සීමාව තුල ව්‍යාපෘතිය නිම කිරීමට අහිතකර ලෙස බලපෑම. | 2019 ජනවාරි 01 අයිසීබී-4 හි කොන්ත්‍රත් ගිවිසුමෙහි සංශෝධන 01 අත්සන් කරන ලදී. 2019 දෙසැම්බර් 31 දිනට අයිසීබී 04 කොන්ත්‍රාත්තුවේ භෞතික ප්‍රගතිය සියයට 26.08 ක් හා මූල්‍ය ප්‍රගතිය සියයට 48.64 ක් ලෙස නිවැරදි විය යුතු අතර මෙම මූල්‍ය ප්‍රගතිය වූ සියයට 48.64 ක් ලෙස ළඟා කරගෙන තිබුනේ මෘදු යකඩ නල සවිකිරීම් උපාංග සහ සියයට 50 ක් ආනයනය කිරීම හේතුවෙන් මෘදු යකඩ නල සවිකිරීම් සහ උපාංග සැපයීම සඳහා භෞතික ප්‍රගතිය යටතේ වෙන්කර ඇති බර තැබීමේ ප්‍රමාණය සියයට 25 කි. ඉතිරි සියයට 75 ක වැඩ ලෙස නල එලීම් සම්පීඩන පරීක්ෂාවන් සහ මාර්ග පුනස්ථාපනයන් වේ. එබැවින් සැබෑ මූල්‍ය ප්‍රගතිය භෞතික ප්‍රගතියට වඩා ඉහල අගයක් ගනී. සමාන්‍යයෙන් සම්පීඩන පරීක්ෂාවෙන් පසුව ස්ථිර මාර්ග පුනස්ථාපනය කිරීම සිදු කෙරේ. නමුත් මාර්ග භාවිත කරන්නන් සහ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් මතුකරන ලද පොදු ගැටළු හේතුවෙන් කොන්ත්‍රාත්කරුට ස්ථිර මාර්ග පුනස්ථාපනය කොටස් කිහිපයක සිදුකිරීමට සිදුවිය. සම්පීඩන පරීක්ෂාවන් කොටස් අනුව සිදු කිරීමට සැලසුම් කර ඇත. (එක් කොටසක දිග ආසන්න වශයෙන් මීටර් 100 ක් පමණ | එළීම් කටයුතු කඩිනම් කිරීම සහ කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ සමීපව අධීක්ෂණය කිරීම. |

| | | | | |
|---|---|---|---|---|
| | | | වේ.) කණ්ඩායම් 2 කින් සමන්විතව නල එලීම් කොටස් 2 කින් සිදුකල නමුත් වැඩ බිමෙහි අනපේක්ෂිත තත්ත්වයන් හේතුවෙන් එම අංශ කිසිවක් සම්පූර්ණ කර නොමැත. | |
| (ඇ) | බලශක්තිය ඉතිරිකිරීම් සඳහා සුදුසු ධාරිතාවයකින් යුතු කාර්යක්ෂම පොම්ප ස්ථාපනය කිරීම සම්ප්‍රේෂන අලාභ අවම කිරීම, සර්ෂණය අඩුකිරීම සහ අනෙකුත් නිෂ්පාදන පහසුකම් වැඩි කිරීම තුලින් අඹතලේ නිශ්පාදන පහසුකම් වල විශ්වාසනීයත්වය වැඩි දියුණු කිරීම සහ බලශක්තිය ඉතිරි කිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව, සමස්ථ ව්‍යාපෘති ක්‍රියාකාරකම් වල බරින් සියයට 45.60 ක් වුවත් ව්‍යාපෘති ක්‍රියාකාරකම් ආරම්භ කර වසර 04 කට පසුව 2018 සැප්තැම්බර් 13 දින ප්‍රදානය කර ඇත. කොන්ත්‍රාත් ප්‍රගති වාර්තාව අනුව 2019 දෙසැම්බර් 31 දිනට අපේක්ෂිත භෞතික ප්‍රගතිය වූ සියයට 53.04 ට එරෙහිව අත්කරගත් භෞතික ප්‍රගතිය සියයට 23.08 ක් පමණක් විය. | ව්‍යාපෘති කාලය දීර්ඝ වීමේ හැකියාව සහ අනාගතයේදී ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යා හැකිය | 1.3(අ) අයිතමයේ දක්වා ඇති හේතු අනුව අයිසීබී 05 හි කොන්ත්‍රාත් ප්‍රගතිය අඩුය. එසේම කොන්ත්‍රාත් අවසන් කිරීම සහ කොන්ත්‍රාත් ආරවුල් හේතුවෙන් මූලික සැලැස්මට අනුව අයිසීබී 3 සහ අයිසීබී 04 සහ කොන්ත්‍රාත් පැකේජ විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. එබැවින්, සමස්ථ ව්‍යාපෘති ප්‍රගතියේ ප්‍රගතිය අඩුය. කෙසේ වෙතත්, ව්‍යාපෘතියේ ඉලක්කගත භෞතික හා මූල්‍ය ප්‍රගතිය 2019 දෙසැම්බර් 31 දිනට පිළිවෙලින් සියයට 53.04 ක් හා සියයට 23.08 ක් ලෙස නිවැරදි කරනු ලැබේ. | නියමිත කාල සීමාව තුල කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට පියවර ගත යුතු අතර කොන්ත්‍රාත්කරුගේ කටයුතු සමීපව අධීක්ෂණය කල යුතුය. |
| (ඈ) | තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ වැඩ ඉටුකිරීමේ නොහැකියාව සහ කොන්ත්‍රාත් ආරවුල් හේතුවෙන් 2019 ජූනි මසදී කි.මී.5 දක්වා මි.මි. 1200 මෘදුයකඩ නල සැපයීමේ සහ ඇතිරීම ඇතුළු ගොතටුව ජලාශය සහ අධිපීඩන බලැති පොම්පාගාරය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සුහදව අවසන් කර තිබුණි. පසුව ආසියානු සංවර්ධන බැංකුව නැවත ප්‍රදානය කිරීමට එකඟතාවය පළකර ඇති අතර දෙවන අවම ලංසුකරුට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. කෙසේවෙතත්, නව කොන්ත්‍රාත්තුව 2020 අගෝස්තු 04 දින මාස 20 ක කොන්ත්‍රාත් කාලයක් සමඟ දෙවන අවම ලංසුකරු වෙත පිරිනැමූ අතර 2013 සිට මේ දක්වා මෙම කොන්ත්‍රතාත්තුව යටතේ බෝවන රෝග රෝහලේ | ව්‍යාපෘති කාලය දීර්ඝ වීමේ හැකියාව සහ අනාගතයේදී ව්‍යාපෘති පිරිවැය ඉක්මවා යා හැකිය | අයිසීබී 03 කොන්ත්‍රාත්තුව මුල් කොන්ත්‍රාත්කරුට ප්‍රදානය කරන අවස්ථාවේ දී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය හා සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම මණ්ඩලය හා සෞඛ්‍ය අමාත්‍යාංශය හා එක්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම අනුව කොන්දේසි සහිතව අයි ඩී එච් ඉඩම ලබාගත හැකි විය. කෙසේ වෙතත් අයිසීබී 03 කොන්ත්‍රාත්තුව සුහදව අවසන් කිරීමේ ක්‍රියාවලිය හේතුවෙන් ජාතික ජලසම්පාදන හා ජලපවාහන මණ්ඩලය විසින් අයි ඩී එච් රෝහල සඳහා නිල නිවාස 06 ඉදි කිරීමේ වගකීම ඉටු කිරීමට නොහැකි විය. | ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට වහාම පියවර ගත යුතුය. |

(අයිඩීඑච්) ඉදිකිරීමට නියමිත ජලාශය සහ බූස්ටර් පොම්පාගාරය සඳහා වූ ඉඩම පිළිබඳ අවසන් නිගමනයට එළඹ නොතිබුණි. එහි ප්‍රතිපලයක් ලෙස ඉඩම ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයට මුදා හැරීමට අයිඩීඑඩ් රෝහලේ කළමනාකරණය විරෝධය එල්ලවූ බැවින් ඉහත කී ඉදිකිරීම අයිඩීඑච් පරිශ්‍රයේ සිට අඹතලේ පරිශ්‍රය වෙත ගෙනයාමට යෝජනා කර තිබුණි. එබැවින් ඒඑෆ්ඩී ණය පහසුකම අවසන් වන 2020 ජනවාරි 31 දිනට පෙර කොන්ත්‍රාත්තුව නිමකිරීමට නොහැකි වනු ඇතිබව නිරීක්ෂණය කෙරේ.

කොන්ත්‍රාත් ප්‍රදානය හා අයි ඩී එච් කළමනාකරණයෙන් ඉඩම් ලබා ගැනීම අතර කිසිදු ගැටළුවක් නොවීය. අවසාන වශයෙන් කොවිඩ්19 වසංගතය සහ අනෙකුත් සෞඛ්‍ය ගැටළු හේතුවෙන් ඉහත අරමුණ සඳහා ඉඩම නිදහස් කිරීම අයිඩීඑච් කළමනාකරණය ප්‍රතික්ෂේප කළ අතර කොවිඩ් 19 වසංගතය පැන නැගීම හේතුවෙන් 2020 අගෝස්තු 4 දිනට අයිසීබී කොන්ත්‍රාත්තුව දෙවන අඩුම ලංසුකරුට ප්‍රදානය කිරීම ප්‍රමාද වීම. කෙසේ වෙතත්, කොන්ත්‍රාත්තුව මාස 20 ක කාල සීමාවක් සඳහා 2020 අගෝස්තු 04 දින ප්‍රදානය කළවුවත් ඒඑෆ්ඩී ණය ගිවිසුම අවසන්වන 2022 ජනවාරි 31 දිනට පෙර කොන්ත්‍රාත්තුව නිම කිරීමට නොහැකි වනු ඇත.

3.3 මතභේදයට තුඩුදුන් කරුණු

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අයිසීබී 04 කොන්ත්‍රාත්තුවේ අංක 03 දරණ ආරවුලට අනුව ෆ්ලාන්ජ් වර්ගයේ සන්ධි සහ රේස්ට්‍රේන්ඩ් සන්ධි සහ සන්ධි ආවරණ ද්‍රව්‍ය (මැස්ටික් ද්‍රව්‍ය) සැපයීම සම්බන්ධයෙන් කොන්ත්‍රාත්කරු මිල ප්‍රමාණපත්‍ර අංක 3.044 යටතේ රු.මිලියන 11.64 ක් ඉල්ලා තිබුණි. කොන්ත්‍රාත් පූර්විකාවෙහි 01 වන කොටසෙහි අංක 03 වගන්තිය මත පදනම්ව ආරක්ෂණ ද්‍රව්‍ය සැපයීම නිශ්චිතවම ආවරණය නොවන බැවින් ඉංජිනේරු විසින් කොන්ත්‍රාත්කරුගේ හිමිකම්පෑම ප්‍රතික්ෂේප කරන ලදී. කෙසේ වෙතත්, කොන්ත්‍රාත් වගන්තිවල ඇති අවිනිශ්චිතතාවය | එකම ද්‍රව්‍ය සඳහා දෙවරක් ගෙවීමේ හැකියාව | මෙම මැස්ටික් ද්‍රව්‍යමය ගැටළුව අයිසීබී 04 යටතේ පවතී. එබැවින් විගණන වාර්තාවේ ප්‍රකාශය නිවැරදි කරනු ලැබේ. කොන්ත්‍රාත්තුවේ නිර්මාණ සැලසුම් කිරීමේදී නල හඳුනාගැනීම පිළිබඳ පැහැදිලිව දක්වා ඇත. කොන්ත්‍රාත්තුවේ පූර්විකාවන්ට අනුව අගල් වල | කිසිදු අවිනිශ්චිතතාවය කින් තොරව කොන්ත්‍රාත් වගන්ති සකස් කිරීමට පියවර ගත යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | හේතුවෙන් ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණය කොන්ත්‍රාත්කරුගේ වාසියට හේතුවිය. එබැවින් ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් කොන්ත්‍රාත් ලේඛණ පිළියෙල කිරීමේදී ෆ්ලාන්ජ් වර්ගයේ සහ රේස්ට්‍රේන්ඩ් වර්ගයේ සම්බන්ධතාවන් දෙවර්ගය සඳහා මැස්ටික්ද්‍රව්‍ය වෙන වෙනම සැපයිය යුතුද යන්න හෝ සැපයුම් පිරිවැය නල එළීම් පිරිවැය තුලට ඇතුලත් කර තිබේද යන්න පිළිබඳ මිල ප්‍රමාණ පත්‍රවල පැහැදිලි විස්තරයක් ලබා දී නොමැති බවට විගණනයේදී නිරීක්ෂණය විය. | | නල එළීම සඳහා රේටයන්ට ඇතුලත් කර ඇත්තේ සන්ධි සඳහා ප්‍රාථමික මැස්ටික් පැතිකඩ මැස්ටික් ටේප් සහ පිවිසී හෝ පොලිතින් පිටත එතීම යන්න නියම කර ඇත. එබැවින් අගල්වල ඇති නලවල සන්ධි සඳහා මැස්ටික් ද්‍රව්‍ය සැපයීමට (ෆ්ලාන්ජ් සන්ධි ෆ්ලාන්ජ් ඇඩප්ටර් කප්ලින් සහ රෙස්ට්‍රේන්ඩ් සන්ධි) මිල ප්‍රමාණ පත්‍රයෙහි නොමැත. එසේම මිල ප්‍රමාන පත්‍ර අයිතම 3.044 හි ෆ්ලාන්ජ් සන්ධි ෆ්ලාන්ජ් ඇඩප්ටරයේ සහ කප්ලින් සඳහා මැස්ටික් ද්‍රව්‍ය සැපයීම සඳහා ලබා දී ඇති එබැවින් කොන්ත්‍රාත් ලේඛණවල අපැහැදිලි බවක් තිබුණි. එසේම කොන්ත්‍රාත් ලේඛණය ව්‍යාපෘතිය විසින් සකස් කර නොතිබුණි. | |
| (ආ) | අයිසීබී 04 හි කොන්ත්‍රාත් වගන්ති සකස් කිරීමේ අපැහැදිලිතාවය නිසා ආරවුල් 03 ක් සම්බන්ධයෙන් ආරවුල් විනිශ්චය මණ්ඩලයේ තීරණ අනුව මූල්‍ය ගාස්තු ලෙස රු.මිලියන 22.50 ක මුදලක් හා විනිශ්චය ගාස්තු ලෙස රු.822,500 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවීම් කර තිබුණි. | අදාල නොවන ක්‍රියාකාරකම් සඳහා ව්‍යාපෘති අරමුදල් භාවිතා කිරීම | අයිසීබී 04 හි කොන්ත්‍රාත් ගිවිසුමෙහි ලේඛනයේ අපැහැදිලිතාවන් හේතුවෙන් මෙම ආරවුල් තුන නිර්මාණය වී ඇත. | තාක්ෂණික හා ව්‍යාපෘති කමිටු විසින් ලංසු ලේඛණ අනුමත කිරීමට පෙර කොන්ත්‍රාත් වගන්ති සියුම්ව ඇගයීම කල යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී ව්‍යාපෘතිය යටතේ භූගත ජලාශය සහ පොම්පාගාරය ඉදිකිරීම සඳහා අයිඩීඑච් පරිශ්‍රයේ ඉඩම් අත්පත්කර ගැනීමේදී බදුගාස්තු, සමීක්ෂන ගාස්තු සහ දැන්වීම් ගාස්තු සඳහා රු.මිලියන 2.37 ක මුදලක් ගෙවීම් කර ඇත. කෙසේ වෙතත්, අයිඩිඑච් පරිශ්‍රයේ යෝජිත ඉදිකිරීම් කටයුතු අඹතලේ පරිශ්‍රයට යොමුකර ඇති බැවින් එම වියදම් ඵලරහිත වියදමක් බවට පත්වී තිබුණි. | ව්‍යාපෘතියට ආර්ථික නොවන වියදමකි | විගණකගේ ප්‍රකාශය සමඟ එකඟ වේ. | එවැනි අනවශ්‍ය වියදම් අවම කිරීම සඳහා පද්ධතිය සංවර්ධනය කළ යුතුය. |

3.4 අක්‍රීය/භාවිතයට නොගත් / ඌණ උපයෝජිත සම්පත්

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
|---|---|---|---|---|
| ------- | --------------------------- | ---------- | ------------------------- | ---------------------- |
| (අ) | ව්‍යාපෘති මූල්‍ය ප්‍රකාශන අනුව ණය කාලසීමාව අවසානයේදී ණය දෙන ආයතනය විසින් වෙන්කරන ලද මුළු ප්‍රතිපාදන ඇ.එ.ජ.ඩොලර් මිලියන 70 න් රු.මි. 2,238.85 කට සමාන ඇ.එ.ජ.ඩොලර් මිලියන 13.86 ක් පමණක් ණය කාල සීමාව අවසානයට උපයෝජනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ණය මුදලෙන් සියයට 80 ක් උපයෝජනය නොවීම නිසා රු.මි.255.14 ට සමාන ඩොලර් මිලියන 1.65 ක බැඳීම් ගාස්තු 2019 දෙසැම්බර් 31 දක්වා මහා භාණ්ඩාගාරයෙන් ගෙවීම් කර ඇති අතර තවද, ණය කාල සීමාව 2022 ජනවාරි 31 දක්වා දීර්ඝ කර ඇති බැවින් අනාගතයේදී අතිරේක බැඳීම් ගාස්තුද දැරීමට සිදුවනු ඇත. | අතිරේක බැඳීම් ගාස්තු දැරීමට සිදුවීම. | ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය අනුව මූල්‍ය බෙදාහැරීම කල යුතු වේ. ඉහත දක්වා ඇති හේතු නිසා ව්‍යාපෘතියට ඉලක්කගත භෞතික ප්‍රගතියක් ළඟාකරගෙන නොමැත. ඒ අනුව අපේක්ෂිත විසර්ජනයන් කිරීමට නොහැකි වූ අතර එහි ප්‍රතිඵලයක් ලෙස ණය පහසුකම් ගිවිසුම පරිදි අරමුදල් සපයන ආයතනය විසින් බැඳීම් ගාස්තු අය කලේය. | වැඩ කඩිනම් කිරීමට පියවර ගත යුතුය |

3.5 පද්ධති සහ පාලන

| අංකය | විගණන නිරීක්ෂණ | බලපෑම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- | --- | --- |
| (අ) | කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2010 ජූලි 26 දිනැති චක්‍රලේඛ අංක 5 මඟින් නියමකර ඇති පරිදි ව්‍යාපෘතියේ ගනුදෙනු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ අභ්‍යන්තර විගණනයට යටත් නොවීය. | ව්‍යාපෘතියේ මූල්‍ය හා මෙහෙයුම් කටයුතු වල දුර්වල පාලනය ව්‍යාපෘති ක්‍රියාකාරීත්වයට අහිතකර ලෙස බලපායි | 2019 මූල්‍ය වර්ෂය සඳහා අභ්‍යන්තර විගණනයක් සිදුකර නොමැත. | අභ්‍යන්තර විගණනය ක්‍රියාත්මක කිරීමට පියවර ගත යුතුය. |